




## යමක වග්ග 11 සහ 12

අසාරෙ සාරමතිනෝ-
සාරෙ චාසාර දස්සිනෝ
තේ සාරං නාරිගච්චන්ති-
මිච්චා සංකප්ප ගෝචරා

නිසරු දේ සරු ලෙසින්
සරු දේ නිසරු ලෙසින්
ගොදුරු කොට ගත් අය
සරු දහමක් නොලබන්නාහුය.

Asare saramatino -
sare casaradassino
Te saram nadhigacchnti -
micchasankappagocara

In the unessential they imagine the essential, in the essential they see the unessential, they who entertain wrong thoughts, never realize the essence.

12.
සාරං ච සාරතෝ නත්වා -
අසාරං ච අසාරතෝ
තේ සාරං අරිගච්චන්ති -
සම්මා සංකප්ප ගෝචරා

සාරවත් දේ සාරවත් ලෙසින්,
නිසරු දේ නිසරු ලෙසින්
නිවැරදිව ගොදුරු කොට ගත් අය
සරු දහමක් ලබන්නාහුය.

Saran ca sarato natva -
asaran ca asarato
Te saram adhigacchanti -
samma sankappa gocara

What is essential they regard as essential, what is unessential they regard as unessential. They who entertain right thoughts realize the essence.

## සත්‍යය නොපිළිගෙන පිරිහීම

රජගහනුවරට නුදුරු උපතිස්ස හා කෝලිත යන බමුණු ගම් උපතිස්ස හා කෝලිත නමින් යොවුන් කුමරුවන් දෙදෙනෙකු සිටියෝ ය. ඔවුන් සිප් සතරෙහි කෙළි පැමිණියෝ ය. යස ඉසුරින් ද අග තැන්පත් ය. රජගහනුවර වසරක් පාසා පැවැත්වෙන සෙල්ලම් සහිත නැටුමක් වෙයි. ඒ බැලීම සඳහා මේ කුමරුන් දෙදෙනාද පිරිවර සමඟ සැම වසරක යෙති. ඒ නළු නිලියන්ට මේ කුමරුවන්ගෙන් බොහෝ වාසිද ලැබේ. නැටුම් ගැයුම් බලමින් සිටි මේ කුමරුවන් හට මේ විහිළු තහළු වල කිසි හරයක් නැතැයි සිතුණේ ය.

මේ කලකිරීම නිසා එකල ඒ පෙදෙසේ ප්‍රසිද්ධව සිටි සංජය ඇදුරා වෙත ගොස් ඒ වත සමාදන්ව ඒ දහම ඉගෙන ගති. ඔවුහු සංජයගේ දහම පරතෙරට ගියහ. නමුදු එයින් ලැබිය හැකි මොක් මඟක් නැතැයි වෙනත් ඇදුරන් සොයා දෙදෙන දෙමගක විසිර ගිය හ. ඒ සත්‍යය සොයා ගත් විට අනෙකාටද දන්වන පොරොන්දුව පිටය. පිසිඟා ව"න අස්සජි මහ රහතන් වහන්සේගේ නිවුණු ගති පැවතුම් සහ දැමුණු ඉඳුරන් සහිතව ව"න අයුරු දැක, මුන් වහන්සේගෙන් වත් සුභ ලකුණක් දැනගත හැකි නම් මැනවැයි සිතා උපතිස්ස පිරිවැජියා අසසජි මහ රහතන් වහන්සේ අසලට ගියහ. පිළිසඳර කතාකොට ඇසූ පලමු දහම් පදයෙන්ම මොක් මඟ හෙලිවිය. සෝවාන් පලයටද



පත්වූහ. ඒ දහම බුදු රජුන් ගේ බව දැන බුදුරජුන් හමුවට යාමට සිතා තම මිතුරු කෝලිතටද ඒ මොක් මඟ හෙලිකරත්ම ඔහුද එය අවබෝධ වී සෝවාන් පලයට පත්වූහ.

දෙදෙනම එක්වී තම ගුරුවූ සංජය පිරිවැජියා වෙත ගොස් තමන් ලැබූ ලාභය සැලකොට බුදුරජුන් හමුවීමට යමුයි කීහ. මේ ධර්මය නියම සත්‍යය නොවන බවත් බුදුරජුන් දේසිත ධර්මය නියම ධර්මය බවත් සංජයට කී කල ඔහු බියට පත්විය. තමාගේ මෝඩකම ඔහුට තේරුම් ගියත් ඒ බව නොහඟවා තරහයෙන් බුදුන් කරා පණ්ඩිතයෝ යන බවත් මා කරා මෝඩයෝ එන බවත් පැවසී ය. උපතිස්ස සහ කෝලිත යන දෙමිතුරෝ බොහෝ පිරිස් සමඟ බුදුරජුන් වෙත ගොස් පැවිදිව රහත්ව අග තනතුරු ද ලදහ. සංජය පිරිවැජියා සත්‍යය පිලිගැනීමට අකමැති නිසා පිරි සොවින් දැවුණේය. බුදුරජුන් ඒ නිමිති කොට නිසරු දහමට පැමිණෙන සදොස් ඇතියන් ද සරු දහම හිමිවන නිදොස් ඇතියන් ද දැක්වූසේක.




සිසිර දිසානායක

## සඳ කිරණයි හිරු කිරණයි

තාරුන්‍යයේ චමත්කාරය අපූරුවට සිය සියුමැලි , මියුරු හඬට කැටිකර ස්වර ඇසුරින් රසික රසිකාවියන් නැලැවීමට හපන් ගායිකාවක් පසුගියදා මෙල්බර්න් නුවර දී ගීතවත් වූණා. මල්වර විය ගෙවනා හිරිමල් යෞවන යෞවනියන් කුල්මත් කරන්නා වූ ඒ හඬත් කුසලතාවයත් සශිකා නිසංසලා ගායන ශිල්පිණියගේයි.

"මම කැමතියි දෙමව්පියන් ගැන ගායනා කළ මගේ අළුත්ම සිංදුවක් ගැන කතා කරන්න."
සන්නස ඇරයුමට අනුව ඇය සිනාසෙමින් මුල පිරුවා.
ඇය හා තනි නොතනියට මෙහි ආ ඇයගේ පියා ජයසුමන මහත්මයාත් ඇයගේ අදහස අනුමත කළ බව සන්නසට දැනුනා. තමන්ගේ ලෙයින් උපන් දරුවෙකු සහජයෙන් ගෙන ආ කුසලතාවයන් ගොනුකර තමන් වෙනුවෙන් යමක් කිරීම පිළිබඳව සතුටුනොවන්නේ කවුරුන්ද?

> සඳ කිරණයි හිරු කිරණයි
> එකළු කළේ මගෙ අහසයි
> කඳුලැල්ලයි හසරැ ල්ලයි
> ළඟ සිටි මගෙ සෙවනැල්ලයි
>
> සෙත් පිරිතයි මල් වැස්සයි
> වී ආවේ සනසන්නයි
> මල් පිපුණේ පළ ලැබුණේ
> මුදු සෙනෙහස පෑ හින්දයි
>
> මං දිනුවේ රැ පිනක් සේ
> හිටි හන්දයි සෙනෙහස මැද
> සුර ඉඳු දෝ වරඟන දෝ
> ආසිරි පෑ මගෙ ලෝකෙට

"මීට අවුරුදු දෙකකට විතර කලින් දවසක ඔස්කා එකේ රැ ස්වීමකට මම ගියා." ඔස්කා කියලා ඉංග්‍රිසි කෙටි යෙදුමකින් හඳුන්වන්නේ ශ්‍රී ලංකාවේ ගීත නිර්මාණ කේන්ද්‍රයයි. "ඒක තිබුනෙ නුගේගොඩ දෙල්කඳ හන්දියේ තියෙන ෆින්තාරු කියන ක්ලබ් එකෙයි. ගීත ක්ෂේත්‍රයට සම්බන්ධවෙලා ඉන්න ගොඩක් දෙනෙක් එතෙන්ට එක්වෙලා හිටියා. එදා දේවල් සින්දු ගැන කථා කලා. මට ඉස්සර වෙලාම මාලනී ඇන්ටි මුණගැහුණෙ ඔතෙන්දි.කලින් ටෙලිපෝන් එකෙන් නම් කථා කරලා තිබුණා."



සශිකා මාලනී ඇන්ටි කියලා කිව්-වෙ මාලනී ජයරත්න මහත්මියට. ඇය ජනප්‍රිය , හරවත් ගීත ගණනාවක් රචනා කළ ද ක්ෂ රචිකාවියක්. ප්‍රවීණ ගායන ශිල්පි ටී.ු.මි. ජයරත්න මහත්මයාගේ දයාබර බිරිඳයි ඇය.

"මම ඉතින් ඇන්ටිට කිව්වා අම්මා ගැන හරි තාත්තා ගැන හරි සිංදුවක් ලියලා දෙන්න කියලා. එතකොට එක පාරටම කිව්වා අපි දෙන්නා ගැනම සින්දුවක් ලියමු කියලා .. දවස් කීපයකට පස්සෙ ඇන්ටි මට කෝල් එකක් දීලා කිව්වා හොඳ එකක් ලියවුණාය කියලා. ටෙලිපෝන් එකෙන්ම වචන ටිකත් කිව්වා. කොතනකවත් අම්මා. තාත්තා කියන වචනය ලියවිලා නැති එකයි සින්දුවේ විශේෂය කියලාත් කිව්වා. මගේ ගීත නිර්මාණ වැඩ කරන්නේ නිල්වලා සමාගම එක්ක. මගේ අධ්‍යාපන වැඩ නිසා හරිම අවිවේකයි. ඒ නිසා මම කැමැති පද රචනා මම ලලිත් අයියාට දෙනවා. ගැලපෙන කෙනෙකුට කියලා තනුව දාන්න. ලලිත් අය්යා තමයි නවරත්න අයියාට තනුව දීලා තිබුනේ. "

ලලිත් වසන්ත ගීත රචකයාද අද දිවයිනේ ජනප්‍රිය ගීත රැ සකට හිමිකම් කියන්නෙක්.

එමෙන්ම නවරත්න ගමගේ සංගීතවේදියාත් නව පරපුරේ ජනප්‍රිය මෙන්ම නර්මාණශීලී සම්මානලාභියෙක් යෞවනයට යෞවනයම පෑහී නැංවුන දෙමාපිය වන්දනාවක්.

"සින්දුව වොයිස් කලේ නෙකා ස්ටුඩියෝ එකේ.බෙන්ස් අංකල්ගෙන් ලැබෙන ගුරු හරුකම්, උනන්දු කිරීම්, අගය කිරීම් නිසාම මම ඒ ස්ටුඩියෝ එකමයි ඉල්ලන්නේ."
මර්වින් බෙන්ස් යනු අද දිවයිනේ සිටින අති දක්ෂ පළපුරුදු ජ්‍යෙෂ්ඨ පටිගතකිරීමේ ශිල්පියෙක්.
"මගේ ඉස්සර වෙලාම කරපු සින්දුව කළේත් බෙන්ස් අංකල්. මොනවා හරි අඩුපාඩුවක් තිබුනොත් එයා කියලා දෙනවා. අපිට නොතේරෙන තැන් එයාට තේරෙනවා. හරියට කරන කල් ආයෙ ආයෙ කියලා දෙනවා. දයානන්ද අංකල් වුනත් ඒ වගේ."
දයානන්ද පෙර්රාද දක්ෂ පටිගතකිරීමේ ශිල්පියෙකි.

20 වන පිටට